ශ්‍රී රාහුල විද්‍යාලය - කටුගස්තොට
සිංහල පැවරුම

1 සිට 10 තෙක් ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න

1. සිංහල හෝඩියේ ඇති (අ) උෂ්මාක්ෂර (ආ) නාසික්‍ය අක්ෂරය බැගින් ලියන්න

2. පහත දැක්වෙන යෙදුම් හේන් ගොවිතැන ආශ්‍රිත භාෂා ව්‍යවහාරයේ යෙදෙන වචන ලියන්න

(අ) වතුර පිපාසය (ආ) කැලය කපා ගිනි තැබු හේන

3. පහත සඳහන් වාක්‍යයෙහි වචන දෙකක අක්ෂර සදෛස් ය. එම වචන පමණක් නිදෛස් කර ලියන්න.
ප්‍රසිද්ධ ගායක ගායිකාවන් රැසක් සංගීත සංදර්ශණය කලට වේලාවට ඇරඹුවේ නැති නිසා නිමකිරිමට සිදුවූයේ අළුයම පහට පමණය

4. පහත සඳහන් පද විසන්ධි කොට ලියන්න

(අ) අත්තම් (ආ) කවීන්ද්‍ර

5. පහත දැක්වෙන අකුරු ඇතුළත් කොට අර්ථවත් වචනය බැගින් ලියන්න

(අ) ධ (ආ) ග

6. පහත සදහන් වාක්‍යයේ යෙදී ඇති නාම පද ස්ත්‍රී ලිංග නාම පද බවට හරවා සම්පූර්ණ වාක්‍යම ලියන්න

වඳුරා ද මුවා ද කොවුලා ද සමගිව විසූහ

7. පහත සදහන් එක් එක් වාක්‍ය ඛණ්ඩය සදහා අර්ථවත් තනිපදය බැගින් ලියන්න

(අ) කිසියම් ව්‍යාපාරයක් සදහා මුදල් යෙදවීම

(ආ) වචන වල සැගවී ඇති තේරුම

8. පහත (අ),(ආ) කොටස්වල දැක්වෙන පදවලට විරුද්ධාර්ථවත් තනි පදයක් ලියන්න

(අ) ප්‍රසාරණය (ආ) සංශ්ලේෂණණය

9. "කල්කිරියාව හොදයි" යන යෙදුමෙන් යමෙකුගේ යහපත් හැසිරීම අදහස්වේ.ඒ

අනුව පහත සදහන් යෙදුම්වල අදහස ලියන්න

10. පහත දැක්වෙන (අ) (ආ) පද කුමන ව්‍යාකරණ ගණයකට අයත්ද?

(අ) ඇතැමෙක්
(ආ) අසද්දී

උඹේ සටහන් පොතට එකතු කරගන්න
රූපිකා ෆොන්සේකා